# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

PMD
Police Media Division
SRI LANKA POLICE

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.04 පැය 1710 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 17 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ඇඹුල්ගම රජමහා විහාරස්ථානයේ පැවැත්වෙන පෙරහැර හේතුවෙන් මාර්ගයේ ගමනාගමනය සීමා කිරීම - හංවැල්ල පොලිස් වසම**

හංවැල්ල පොලිස් වසමේ ඇඹුල්ගම රජමහා විහාරස්ථානයේ පවත්වනු ලබන ශ්‍රී සම්බුද්ධ ජයන්ති ආශිර්වාද වාර්ෂික මහා පෙරහැර 2025.01.02, 03 හා 04 තෙදින පුරා පැවැත්වීමට නියමිතව ඇත. මෙම පෙරහැරේ රන්දෝලි පෙරහැර 2025.01.04 වන අද දින පැය 2000 සිට 2025.01.05 වන දින පැය 0300 දක්වා අලි ඇතුන් හා නර්ථන කණ්ඩායම් සහභාගි කරවා ගනිමින් අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇති අතර මෙම පෙරහැර නැරඹීම සඳහා විශාල බැතිමතුන් පිරිසක් පැමිණෙතැයි අපේක්ෂා කරනු ලබයි. එම හේතුවෙන් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒ අනුව මෙම රන්දෝලි පෙරහැර ඇඹුල්ගම රජමහා විහාරස්ථාන භූමියෙන් ආරම්භ කර ජල්තර මාර්ගයේ සමගි මාවත හරහා පරණ පාර (ලෝලෙවල්) කොළඹ ප්‍රධාන මාර්ගයට පිවිස ඇඹුල්ගම හංදිය දක්වා පැමිණ ජල්තර - පනාගොඩ මාර්ගයේ ඔස්සේ නැවත විහාරස්ථානය වෙත ගමන් කිරීමට නියමිතය.

එබැවින් පෙරහැර ගමන් ගන්නා කාලය තුල එම මාර්ග භාවිතා කරන රියදුරන් හා මහජනතාව වෙත පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් ඉල්ලා සිටියි.

**භාවිතා කල හැකි විකල්ප මාර්ග**

- කොළඹ දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වන වාහන රනාල මංකඩ හන්දියෙන් කැකුලංවල මාර්ගය හරහා පනාගොඩ 293 මාර්ගයේ පනාගොඩ හන්දියෙන් ගොඩගමට ගොස් හයිලෙවල් මාර්ගය හරහා අවිස්සාවේල්ල දෙසට ගමන් කල හැකිය.

- අවිස්සාවේල්ල දෙස සිට කොළඹ දෙසට පැමිණෙන වාහන හයිලෙවල් මාර්ගය භාවිතා කල හැකිය.

- 293 පනාගොඩ හෝමාගම මාර්ගයේ ගමන් කරන වාහන කැකුලංවල මාර්ගය මංකඩ හන්දියෙන් ලෝලෙවල් මාර්ගයට පිවිස හැකිය.

- අවිස්සාවේල්ල දෙස සිට කොළඹ දෙසට හා කිරින්දිවෙල දෙස සිට ලෝලෙවල් මාර්ගයේ කොළඹ දෙසට ගමන් කරන වාහන හංවැල්ල සමනල හන්දියෙන් සමනබැද්ද මල්වාන හරහා කඩුවෙලට ගමන් කල හැකිය.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය